# ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ සුභ පැතුම් පණිවිඩය



සමෘද්ධිමත් කෘෂි ආර්ථිකයක් බිහිකරලීමේ නිරන්තර උත්සාහයක නිරත වන කෘෂිකර්ම අමාත්‍යාංශය ඒ සඳහා ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ආරම්භ කළේය. එහිදී තුන් අවුරුදු ආහාර නිෂ්පාදන සැලසුම් අනුව රටේ ආහාර නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානය යොමුව ඇත. දිවයිනේ සෑම ප්‍රදේශයක්ම, දිස්ත්‍රික්කයක්ම සහ පළාතක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන වෙනුවෙන් ප්‍රමුඛ දායකත්වය ලබාදීමට හැකිවීම වත්මන් කෘෂිකර්ම අමාත්‍යවරයා ලෙස මා ලද අනගි අවස්ථාවකි. මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සහ සාර්ථකව ක්‍රියාත්මක වෙතැයි මා තුළ දැඩි විශ්වාසයක් පවතින අතර ඒ සඳහා හදවතින්ම සුබ පැතුම් එක්කරමි.

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යනු එක් පාර්ශවයකට පමණක් සිදු කළ හැකි දෙයක් නොවේ. සියලුම පළාත් මෙම වැඩසටහන සඳහා උපරිම දායකත්වය සැපයිය යුතුය. සෑම පාර්ශවයක් විසින්ම කළ යුතු කාර්යයන් නිසියාකාරව ඉටු කිරීම තුළ පමණක් මෙහි සාර්ථකත්වය රැඳී පවතියි.

මෙම තුන් අවුරුදු සැලැස්ම අනුව වඩාත් ක්‍රමානුකූලව වගා කටයුතු සිදු කළ යුතුය. ඒ ඒ පළාත්වල පවතින පාරිසරික සාධක මත පිහිටා පසට ගැලපෙන බෝගය හඳුනාගෙන වගා සැලැස්ම ක්‍රියාත්මක කිරීම වැදගත්ය. මෙම සාමුහික ක්‍රියාවලියේ දී ජාතික ඉලක්ක ජය ගැනීමට නම් පළාත් අතර නිවැරදි සන්නිවේදනයක් තුළින් අන්‍යයෝන්‍ය අවබෝධය වර්ධනය කර ගත යුතුය.

රටේ ජනතාවගේ පරිභෝජනය සඳහා අවශ්‍ය ආහාර රට තුළම නිෂ්පාදනය කරමින්, කෘෂි ආර්ථිකය සවිබල ගන්වන ගොවි ප්‍රජාවගේ අතමිට සරු කරමින් කෘෂිකර්ම අංශය දියුණු කිරීමට ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ඉවහල් වනු ඇත. ඒ  සඳහා දිවයිනේ සෑම පළාතක්ම ස්වකීය වගකීම නොපිරිහෙලා ඉටු කරනු ඇතැයි මම අපේක්ෂා කරමි. සීමා මායිම් පසෙකලා එකම අරමුණක් වෙනුවෙන් අප සැම එක්වන්නේ නම්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අපේක්ෂාව සඵල වනු නිසැකය.

දුමින්ද දිසානායක (පා.ම)
කෘෂිකර්ම අමාත්‍ය

# කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



දූපත් රාජ්‍යයක් වන අප විශිෂ්ඨ ගණයේලා සම්පත්වලට හිමිකම් කියන අතර ඉන් එක් සම්පතක් ලෙස කෘෂිකර්මාන්තය හැඳින්විය හැක. ග්‍රාමීය ජනතාවගෙන් 65% ක් පමණ කෘෂි ආර්ථිකයකට අයිතිවාසිකම් කියන අතර ඔවුන්ගේ දිවි පැවැත්ම කෘෂිකර්මාන්තය සමඟ බැඳී පවතී. තවද කාර්මික විප්ලවයත් සමඟ ලෝකයේ බොහෝ රටවල් නොයෙකුත් යාන්ත්‍රික කර්මාන්තවලට යොමු වීමත් සමඟ කෘෂිකර්මාන්තයට වූ අවධානය අඩු විණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් විවිධ කතිකා ගෝලීය වශයෙන් ඇති කිරීමටත් විවිධ සම්මුතීන් ගෝලීය වශයෙන් ගෙන ඒමටත් සිදු විණි. අප ඉදිරියේ එලෙස පවතින ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අවධානම අවම මට්ටමක පවත්වා ගෙන යාම සඳහා ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි ගරු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක ඇමතිතුමාගේත්, ජනාධිපති කාර්යාලය සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ මැදිහත් වීම මත ජාතික ආහාර නිෂ්පාදන තුන් අවුරුදු සැලැස්ම එළි දක්වන ලදී. මෙහි මුඛ්‍ය පරමාර්ථය වූයේ අප මිහිතලය තුල ස්වයංපෝෂිත ලෙස නිෂ්පාදනය කළ හැකි ආහාර බෝග වගා කිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම, යටිතල පහසුකම්, බීජ, පොහොර වැනි අංග ලබා දෙමින් ගොවි ජනතාව සමඟ කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන එක් කර ගනිමින් 2018 වන විට මිරිස්, බී ලූණු, අල, මුං ඇට වැනි තෝරා ගත් මූලික බෝග ලැයිස්තුවකින් රට ස්වයංපෝෂිත කරවීමය. මෙම කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ධෛර්යය සහ ශක්තිය සමස්ථ ගොවි ජනතාවටත් සියලුම නිලධාරීන්ටත් ලැබේවායි පතමි.

වසන්ත අලුවිහාරේ (පා.ම)
කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය

# මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ පණිවිඩය



මානව ශිෂ්ඨාචාරයේ මින් පෙර කිසිම දිනක නොවූ විරූ ලෙස වර්තමානයේ ආහාර නිෂ්පාදනයේ මෙන්ම ආහාර සුරක්ෂිතතාවයේ වැදගත්කම ජගත් ප්‍රජාවට මනාව තේරුම් ගොස් ඇත. විශ්ව ගම්මානයේ ජීවත්වන ශ්‍රී ලංකාවාසී අපටද මෙම අභියෝගයෙන් මිදි සිටීමට නොහැකි වී ඇති අතර පවතින තත්ත්වය මනාව වටහාගත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා වන මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන්ගේ සංකල්පයකට අනුව ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන 2015 වසරේ සිට 2018 වසර දක්වා අප මාතෘ භූමියේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබීම ඉතා වැදගත්කොට සැලකිය යුතු වේ.

සීමිත භූමි ප්‍රමාණයක කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන මැද රට ගොවි ජනතාවට නව කෘෂිකාර්මික සංකල්ප හඳුන්වා දෙමින් එම සීමිත ගොවිබිම්වලින් ප්‍රශස්ථ ඵලදාවක් ලබා ගනිමින් ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට පළාත් සභාවක් ලෙස සක්‍රීය ලෙස දායක වීමට මධ්‍යම පළාත් සභාවට හැකිවීමත්, එහි සාඩම්බර කොටස්කරුවෙක් වීමට මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූලික වූ විෂය භාර ගරු අමාත්‍යතුමා, ලේකම්තුමා ඇතුළු සියලූ නිළධාරීන්ට හා පළාතේ ගොවි ජනතාවට අවස්ථාවක් ලබාදීම පිළිබඳ ඉමහත් සතුටට පත්වෙමි.

සරත් ඒකනායක
මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍ය

# මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යතුමාගේ පණිවිඩය



ලෝකය මේ වන විට දරුණු ආහාර අර්බුදයකට ගමන් කරන බවට ලෝක විද්වතුන්ගේ මතය වී ඇත. මෙම අභියෝගය ජයගැනීම හමුවේ ජාතියක් ලෙස ඉටු කිරීමට දැවැන්ත වැඩ කොටසක් අප වෙතද පැවරී ඇත. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන්ගේ උදාර සංකල්පයක් අනුව නිර්මාණය වූ ජාතික ආහාර වැඩසටහන ශ්‍රී ලාංකික ජනතාවට මුහුණ දීමට සිදුවන අනාගත අභියෝගය ජය ගැනීමට මහත් පිටුවහලක් වනු ඇතැයි මා තරයේ විශ්වාස කරමි.

මෙම ජාතික වැඩසටහනට සමගාමීව මධ්‍යම පළාතේ ආහාර නිෂ්පාදනය ප්‍රශස්ථ ලෙස වැඩිදියුණු කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගෙනයන සුවිශේෂී වැඩසටහනට සුබ පැතුම් පණිවිඩයක් සටහන් කිරීමට ලැබීම මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යවරයා වශයෙන් මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

2015 සැප්තැම්බර් මස වාද්දුවේදී පැවති පළාත් කෘෂිකර්ම අමාත්‍ය සමුළුවේදී ඒකඟව ප්‍රකාශ කළ වාද්දුව ප්‍රකාශය අනුව වැඩකටයුතු සිදුවීම ඉමහත් සතුටට කරුණකි.

උඩරට එළවළු නිෂ්පාදනයේ ප්‍රමුඛත්වය හිමිකරගෙන සිටින අප ජාතික ලොකු ලූණු නිෂ්පාදනයේ 40% ද අර්තාපල් නිෂ්පාදනයේ 35% පමණ ද ජාතික නිෂ්පාදනයට ලබා දෙන පළාතකි. එමෙන්ම බීජ බෝංචි නිෂ්පාදනයට මෙන්ම බීජ අර්තාපල් නිෂ්පාදනයටද බීජ ලොකු ලූණු නිෂ්පාදනයටද අප පළාත ලබා දෙන දායකත්වය සුළු පටු නොවේ. මෙම තත්ත්වය අනාගතයේදී වඩාත් වර්ධනය කරගනිමින් ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සක්‍රීය ලෙස දායක වීමට පළාතක් ලෙස මධ්‍යම පළාත කැපවීම මාගේ ඒකායන අධිෂ්ඨානයයි.

එම්. රාමේෂ්වරන්
මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, ධීවර, පරිසර කටයුතු, හින්දු සංස්කෘතික සහ වතු යටිතල පහසුකම් අමාත්‍ය

FOOD FIRST

**වවන්නෝ අනර්ඝ පුරවැසියෝ ය. ඔවුන් තම රට හා සබැඳිය.**

**- තෝමස් ජෙෆර්සන්**

**(මහා ගත්කරු හා ඇමරිකානු ජනාධිපති)**

# පටුන


01. හැඳින්වීම ---------------------------------------------------------------------------------- 1-2

02. පළාත් සිතියම -------------------------------------------------------------------------------- 3

03. පළාත් ඉලක්ක සාරාංශය --------------------------------------------------------------------- 4-5

04. මහනුවර දිස්ත්‍රික්ක ඉලක්කය ---------------------------------------------------------------- 6-39

05. මාතලේ දිස්ත්‍රික්ක ඉලක්කය ------------------------------------------------------------------ 40-71

06. නුවරඑළිය දිස්ත්‍රික්ක ඉලක්කය---------------------------------------------------------------- 72-92